# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2131/56 – 2019 ජූලි 12 වැනි සිකුරාදා – 2019.07.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලබඩ පත්තුව නැගෙනහිර සුළු කොට්ඨාසයේ, පාතේගම මධ්‍යම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/ඩීකේඩබ්ලිව්/2015/517 හා 2016.02.16 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – රබර්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0340**

උතුරට: මාතර, කතරගම යෝජිත දුම්රිය මාර්ගය සඳහා අත්කරගෙන ඇති ඉඩම; නැගෙනහිරට: කැබලි අක්ෂර බී, හිමිකරු සොයාගත නොහැකි කෝන්ගහකොරටුව හෙවත් පාළුවත්ත සහ සුගතපාල පලිහක්කාර හිමිකම් කියන රබර්වත්ත; දකුණට: සුගතපාල පලිහක්කාර හිමිකම් කියන රබර්වත්ත; බටහිරට: දළුගම ගමගේ පියසේන හිමිකම් කියන කරඳගොඩ සහ සහ මාතර කතරගම යෝජිත දුම්රිය මාර්ගය සඳහා අත්කරගෙන ඇති ඉඩම.

02. **කැබලි අක්ෂර 'බී' – කෝන්ගහකොරටුව හෙවත් පාළුවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0222**

උතුරට: මාතර, කතරගම යෝජිත දුම්රිය මාර්ගය සඳහා අත්කර ගෙන ඇති ඉඩම; නැගෙනහිරට: ඩී. එච්. පලිහක්කාර හිමිකම් කියන රබර්වත්ත සහ හිමිකරු සොයාගත නොහැකි කෝන්ගහකොරටුව හෙවත් පාළුවත්ත; දකුණට: හිමිකරු සොයාගත නොහැකි කෝන්ගහකොරටුව හෙවත් පාළුවත්ත; බටහිරට: කැබලි අක්ෂර ඒ සහ මාතර කතරගම යෝජිත දුම්රිය මාර්ගය සඳහා අත්කරගෙන ඇති ඉඩම.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/11/2015/එන්ආර්ඩී/14.
2019 මැයි මස 07 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 - 945

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිවිනි පළාත කෝරළේ සුළු කොට්ඨාසයේ පල්ලේගම (55ඒ) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ වෙල්ලේවෙල (අ.ග.පි. 18) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක බී/එච්එල්ඊ/2016/408 හා 2017.05.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – පිටහඇල්ලේපතන – ප්‍රමාණය: හෙක්. 0.4047ක් පමණ**

උතුරට: කැබලි අංක අ.ග.පි. 18හි 216 සහ 219; නැගෙනහිරට: කැබලි අංක අ.ග.පි. 18හි 219; දකුණට: කැබලි අංක අ.ග.පි. 18හි 216 සහ 219; බටහිරට: කැබලි අංක අ.ග.පි. 18හි 216.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2016/ඩබ්ලිව්එස්/311.
2018 ඔක්තෝබර් මස 25 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 - 946

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.